ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: 02/15/12/22

# මාධ්‍ය නිවේදනය

වතුකරයේ ජනතාව වෙත තැපැල් සේවා පහසුකම් නොලැබීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්වයං මැදිහත්වීම මත පරීක්ෂණයක් ආරම්භ කර ඇත. වතුකරයේ ජනතාව ද මුදල් ගෙවා තැපැල් සේවාවන් ලබාගැනීමට කටයුතු කරන විට නිසි පරිදි එම සේවාවන් උක්ත කණ්ඩායම් වෙත නොලැබීම මත මෙම ජනතාව වෙනස්කමකට ලක්වීම සිදුවීම පදනම්ව මෙම පැමිණිලි විභාගය ආරම්භ කරන ලදී. මෙම පැමිණිලි විභාගයේ දී උක්ත ගැටළුවට සම්බන්ධ පාර්ශවයන් කිහිපයක් පිළිබඳ අනාවරණය වූ අතර, ඒ අනුව එහි පාර්ශවකරුවන් ලෙස තැපැල් දෙපාර්තමේන්තුව, තැපැල් අමාත්‍යාංශය, වතු යටිතල අමාත්‍යාංශය සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හඳුනාගන්නා ලදී. එහිදී දෙමළ භාෂාව පිළිබඳ හැකියාව ඇති ලිපි බෙදන්නන්ගේ හිඟය, වතුකරයේ පැවති නියෝජිත තැපැල් කාර්යාල වැසීයාම සහ වතුකරයේ නිවාස වෙන්කර හඳුනාගැනීම සඳහා එක් එක් නිවාසය සඳහා ගෘහ අංකයක් නොමැතිවීම යන ගැටළු කෙරෙහි මෙම පරීක්ෂණයේ දී අවධානය යොමු කරන ලදී.

ඒ අනුව 2022 දෙසැම්බර් මස 15 වන දින මෙම ගැටළුවට අදාළ පාර්ශවයන් කැඳවා පරීක්ෂණ කටයුතු සිදුකරන ලදී. එහිදී පැමිණ සිටි ඉහත පාර්ශවයන් 2023 ජනවාරි මස 06 වන දින වන විට මෙම ගැටළුවට අදාළව මේවන විට සිදුකර ඇති මැදිහත්වීම් සහ ඒ හා බැඳුණු ගැටළු සහ ආයතනික මට්ටමින් ඒ පිළිබඳ ඉදිරිපත් කරන විසඳුම් යෝජනා ඇතුළත් පූර්ණ වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමුකිරීමට එකඟ වූ අතර එම තොරතුරු ද පදනම් කරගෙන ඉතාමත් කඩිනමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙම ගැටළුවට අදාළව නිර්දේශ අදාළ ආයතන සහ සම්බන්ධිත ආයතන වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2022.12.15